# ප්‍රවෘත්ති නිවේදනය: මානව හිමිකම් කණ්ඩායම් යුද අපරාධ චෝදනා ගොණුකිරීම හමුවේ බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති පලායයි

***29 අගෝස්තු 2017***

**බ්‍රසීලියා/ලන්ඩන්:** ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ අවසාන අධියරේදී ඉටුකළ භූමිකාව සම්බන්ධයෙන් ලතින් ඇමරිකාවේ ශ්‍රී ලංකා තානාපති ජගත් ජයසූරියට එරෙහිව, සත්‍යය සහ යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) විසින් බ්‍රසීලයේ සහ කොලොම්බියාවේදී යුද අපරාධ පිළිබඳ චෝදනා ගොනු කරනු ලැබ තිබේ. යුද්ධයේ අවසාන මාස කිහිපය තුළ 40,000ත් 70,000ත් අතර දෙමළ සිවිල් වැසියන් ප්‍රමාණයක් ඝාතනය කරන ලදැයි එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇස්තමේන්තු කර ඇති අතර, ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් විසින් සැළසුම් සහගත හා බහුල ලෙස  ජාත්‍යන්තර මානුෂීය නීති උල්ලංඝනය කළ බවට නිගමනය කිරීමට සෑහෙන කාරණා එම සංවිධානය විසින් 2015දී සිදුකළ විමර්ශනයකින් සොයාගන්නා ලදී.

සඳුදා (28) දිනයේදී බ්‍රසීලයේ බ්‍රසීලියා නගරයේ හා කොලොම්බියාවේ බොගෝටා නුවරදී ගොණුකරන ලද පැමිණිලි මගින් චෝදනා කර සිටින්නේ යුද කලාපයේ රෝහල් ඉලක්ක කොට නැවත නැවතත් එල්ල කළ ප්‍රහාරයන්, වධ හිංසා හා ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා, බලහත්කාරී අතුරුදහන්කිරීම් හා බහිර්නීතික ඝාතන සිදුකළ හමුදා ඒකකවල ආඥාපතිවරයා වශයෙන්, එකී සාපරාධී ක්‍රියා සම්බන්ධයෙන් ජෙනරාල් ජගත් ජයසූරිය වෙත තනි පුද්ගල අපරාධ වගකීම පැවරෙන බවයි.

"ඔහු විසින් සිදුකර ඇති දෑ සළකා බැලීමේදී, එක්සත් ජාතීන්ගේ සංවිධාන වාර්තා මගින් නම් කරන ලද මෙවැනි පුද්ගලයෙක් රාජ්‍ය තාන්ත්‍රික මුක්තිය සහිතව බලලත් තානාපති නිලධාරියකු ලෙස විදේශ රටකට පත්කොට යැවීම වනාහී සාහසික ක්‍රියාවකි. ජෙනරාල්වරයා අධිකරණය හමුවේ පෙනී සිටිනු දැකීමට සත්‍යය සහ යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) සහ එහි ලතින් ඇමරිකානු හවුල්කාර සංවිධාන කැමැත්තෙන් සිටිය ද, ඒ වෙනුවට ඔහු හදිසියේම ලතින් ඇමරිකානු කලාපයෙන් පෙරළා ශ්‍රී ලංකාවට පලාගොස් ඇති බව අපට වැටහී ඇතැ'යි ITJP සංවිධානයේ විධායක අධ්‍යක්ෂ හා දකුණු අප්‍රිකානු මානව හිමිකම් නීතිඥවරියක වන යස්මින් සූකා ප්‍රකාශ කළාය. "තමන්ගේ නිර්දෝෂීභාවය පිළිබඳව ඔහු අවංකව විශ්වාස කළේ නම් ස්වකීය තනතුරේ රැඳී සිටිමින් අධිකරණ ක්‍රියාමාර්ගයට මුහුණදීමට ජෙනරාල් ජයසූරිය කටයුතු කළ යුතුව තිබුණේ "යැයි ද ඇය වැඩිදුරටත් කියා සිටියාය. "නීතියේ ආධිපත්‍යය සහ වගඋත්තරදායකත්වය පිළිබඳ ශ්‍රී ලංකාව සැබැවින්ම කැප වී ක්‍රියා කරන්නේ නම් ඔහුට විරුද්ධව චෝදනා ගොණුකිරීමට අවස්ථාව මෙයයි."

ලතින් ඇමරිකානු සංවිධානයන්ගේ සාමාජිකයෙකු සමග හවුලේ ගොණු කරන ලද මෙකී පැමිණිලි සම්බන්ධීකරණය කරන ලද්දේ, ආර්ජන්ටිනියානු ජෙනරාල් හොර්හේ විදේලා සහ චිලියානු ජෙනරාල් අවුගුස්තෝ පිනෝචේට එරෙහි නඩු විභාගවලට මුල පිරුවා වූද, පසුකාලීනව ගුවාතමාලාවේ දණ්ඩ මුක්තියට එරෙහි ජාත්‍යන්තර කොමිසමේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරමින් හිටපු ජනාධිපති අල්ෆොන්සෝ පොර්තීයෝ ඇතුළු ගුවාතමාලානු යුද අපරාධකරුවන්ට හා සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයන්ට එරෙහිව අධිචෝදනා ගොණු කළාවූ ද, ස්පාඤ්ඤ අභිචෝදක කාර්ලෝස් කස්ත්‍රෙසානා ෆෙර්නැන්දෙස් විසිනි.

"ජෙනරාල් පිනෝචේ හා ජෙනරාල් විදේලාට එරෙහිව අපි විසින් ආරම්භ කළා වූ නඩු විභාගයන්ටත් වඩා දරුණු අපරාධ පිළිබඳ සාක්ෂි මීට ඇතුළත්ව තිබීම ගැන මම විස්මයට පත්වෙමි'යි කස්ත්‍රෙසානා ප්‍රකාශ කළේය. "පිනෝචේගේ නඩු විභාගය ඵලදායක වනු ඇතැයි කියා හෝ ආර්ජන්ටිනියානු මිලිටරි ජුන්ටාව වගඋත්තරදායී කිරීමට ආර්ජන්ටිනියානු අධිකරණය සමත් වනු ඇතැයි කිසිවකු මුලින් විශ්වාස නොකළේය; ගුවාතමාලානු ආරක්ෂක හමුදා වගඋත්තරදායකයන් කිරීමට හැකිවනු ඇතැයි ද කිසිවකු විශ්වාස නොකළේය. නමුත්, කැපවුණු, අතළොස්සක්  දෙනා සමග වින්දිතයන්ට යුක්තිය ලබාදීමට හැකියාවක් පවතින බැව් ඔබට කියන්නට මට ඕනෑ යි", හේ කියා සිටියේය. "ජෙනරාල් ජයසූරිය බ්‍රසීලයෙන් පලායාම ගැන මම එතරම් වද නොවෙමි; නඩුව ආරම්භවන්නේ දැන් ය. ඔහු අපගේ කාර්යය වඩා පහසු කර තිබේ. මන්ද යත් පලා යාම හේතුවෙන් ඔහු තව දුරටත් රාජ්‍ය තාන්ත්‍රික මුක්තියට හිමිකම් නොකියන බැවිනි."

2007 - 2009 කාල වකවානුව තුළ වන්නි හමුදා ආඥාපතිවරයා වශයෙන් ක්‍රියාකළ ජෙනරාල් ජගත් ජයසූරිය, දෙමළ සිවිල් වැසියන් වගවිභාගයකින් තොරව බෝම්බ හා ෂෙල් ප්‍රහාරයන්ට බඳුන් කරමින් රෝහල් පවා

ඉලක්ක කළා වූ යුද්ධයේ අවසාන අධියරේ දී සමස්ත යුද චර්යාවන් අධීක්ෂණය කළ බවට ඔහු විසින්ම පිළිගෙන තිබේ. ජෙනරාල් ජයසූරිය මෙකී මෙහෙයුම් අධීක්ෂණය කරන ලද්දේ ශ්‍රී ලංකාවේ කුප්‍රකට වධක බිමක් වූ 'ජෝසප් කඳවුරේ' ස්ථානගතව සිටිමිනි. ජෙනරාල්වරයා මෙකී කඳවුරේ අණදෙන නිලධාරියා ව ක්‍රියාකරන සමයේ දී එම ස්ථානයේ වධ හිංසාවන්ට හා/හෝ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට පාත්‍ර කරන ලද වින්දිතයන් 14 දෙනකුගේ සාක්ෂි ප්‍රකාශයන් ITJP සංවිධානය විසින් එක්රැස් කර තිබේ. විලංගු සහ යදම්වැලින් ද, රැඳවියන් දෙපයින් එල්ලීමට යොදාගන්නා කප්පි ද, ඔවුන් සිවිලිමට විලංගුලන පිණිස සවිකළ යදඬු හා භූගත සිරකුටිවලින් ද සැදුම්ලත් වධක මැදිරි ජෝසප් කඳවුර තුළ තනා තිබිණ. වෙනත් රැඳවියන් රාත්‍රියේ දී විලාප දෙනු ඇසුණු බවට වින්දිතයන් විස්තර කර ඇති අතර එම විලාපයන් සිය කඳවුරු නිල නිවස්නයේ සිටි ජෙනරාල්වරයාට ද ඇසීමට හැකියාවක් තිබිය යුතු ය.

ශ්‍රී ලංකාවේ ගැටුම් අවසානයේ යටත් වූ සිය ගණනක් නීතියට බැහැරව ඝාතනය කිරීම සහ බලහත්කාරී ලෙස අතුරුදහන්කිරීම සම්බන්ධයෙන් විධාන වගකීම, යුද හමුදාපති ධූරයේ කටයුතු කළ ජෙනරාල් ජයසූරියට පැවරෙන බවට ද පැමිණිල්ල මගින් චෝදනා එල්ල කර තිබේ. අට වසරක් ඇවෑමෙන්, ස්වකීය දූ පුතුන්ගේ ඉරණම පිළිබඳ තතු හෙළිකරන මෙන් ඉල්ලා ඔවුන්ගේ සේයා රූ ඔසවාගත් අතුරුදහන්වූවන්ගේ පවුල් සාමාජිකයෝ උතුරු සහ නැගෙනහිර මාවත් අද්දර දෛනික විරෝධතා දක්වති.

"අගෝස්තු 30 වැනිදා අතුරුදහන්වූවන් පිළිබඳ ජාත්‍යන්තර දිනය සමරන අපි, අතුරුදහන්වීම් අත්විඳි රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ වින්දිතයන් හා ඔවුන්ගේ පවුල් වෙත සහයෝගීතාව පළකරන්නෙමු"යි යි කොලොම්බියානු නීතිවේදී කොමිසමේ හුආන් කාර්ලොස් ඔස්පිනා ප්‍රකාශ කළේය. "යුක්තියෙන් තොරව ජීවත්වීම කෙසේ දැයි අප හොඳින් දන්නා අතර අන්‍යායන් වෙනුවෙන් දණ්ඩ මුක්තිය හා පොරබැදීමට කළ හැකි යමක් වේ නම් ඊට සහාය දීම අපගේ රාජකාරියක් සේ අපි සළකන්නෙමු" යි හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

## පුද්ගල චරිත සටහන් :

**යස්මින් සූකා** මානව හිමිකම් පිළිබඳ ප්‍රමුඛ නීතිඥවරියක මෙන්ම සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ ප්‍රවීණයෙකි. දකුණු අප්‍රිකාවේ හා සියෙරා ලියෝන්හි සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිසම් සාමාජිකාවක වශයෙන් ක්‍රියාකර ඇති ඇය ශ්‍රී ලංකාව පිළිබඳ පත්කරන ලද එක්සත් ජාතීන්ගේ විශේෂඥ මඩුල්ල සම්බන්ධයෙන් බන් කී මූන්ගේ නීති උපදේශකවරියක වශයෙන් ද කටයුතු කළාය. ප්‍රංශ සේනාංක විසින් මධ්‍යම අප්‍රිකානු ජනරජය තුළ සිදුකළ ලිංගික ප්‍රචන්ඩ ක්‍රියා සොයා බැලීම සඳහා පත්කළ එක්සත් ජාතීන්ගේ විමර්ශන මණ්ඩලයේ ද සේවය කළ ඇ වර්තමානයේ දී දකුණු සූඩානයේ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිසමේ මූලසුන දෙවන වසරටත් හොබවන්නීය. ශ්‍රී ලංකාවේ යුද අපරාධවලින් දිවි ගළවාගත්තවුන් සහ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි ප්‍රකාශයන් රැස් කරනු වස් 2013දී පිහිටුවන ලද සත්‍යය සහ යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර ව්‍යාපෘතියේ (ITJP) මූලිකත්වය දරන සූකා මහත්මිය දකුණු අප්‍රිකාවේ මානව හිමිකම් පදනමේ විධායක අධ්‍යක්ෂවරිය ලෙස ක්‍රියා කරයි.

**කාර්ලෝස් කස්ත්‍රෙසානා ෆෙර්නැන්දෙස්** 2007 - 2010 අතර කාල පරිච්ඡේදය තුළ ගුවාතමාලාවේ දණ්ඩ මුක්තියට එරෙහි කොමිසමේ කොමසාරිස්වරයා ලෙස කටයුතු කළේය. 1989 සිට ස්පාඤ්ඤයේ රජයේ වෘත්තීය අභිචෝදකයන්ගේ සාමාජිකයකු වශයෙන් හේ 2005 සිට මැඩ්රිඩ් නුවර ශ්‍රේෂ්ඨාධිකරණයේ සේවය කරයි. නීතිඥයකු, විමර්ශන විනිසුරකු, මහේස්ත්‍රාත්වරයකු මෙන්ම සංවිධානාත්මක අපරාධ හා වංචා දූෂණයන්ට එරෙහි විශේෂ අභිචෝදකයකු වශයෙන් ද හෙතෙම මීට කලින් ක්‍රියාකර තිබේ. 1996දී ආර්ජන්ටිනියානු සහ චිලියානු මිලිටරි ජුන්ටාවන්ට එරෙහි පැමිණිලි ගොණුකරමින් සුප්‍රකට පිනෝචේ නඩු විභාගයට මුල පුරන ලද්දේ ඔහු විසිනි. ස්පාඤ්ඤයේ ජාතික මානව හිමිකම් ත්‍යාගයෙන් ද, මැක්සිකෝවේ ගුවාදලහාරා සරසවිය හා චිලියේ මධ්‍යම සරසවිය මගින් ප්‍රදානය කළ ගෞරව ආචාර්ය ධූරයන්ගෙන් ද, ගුවාතමාලාවේ ශ්‍රේෂ්ඨ කෙට්සාල් කුරුසියෙන් ද, ඉතාලියේ සහයෝගිතා තරුව ප්‍රණාමයෙන් ද, ප්‍රංශයේ Légion d'Honneur ගෞරව නාමයෙන්ද, ස්පාඤ්ඤයේ සිවිල් නිපුණතා පදක්කමින් ද සම්මානිත කස්ත්‍රෙසානා වෙනත් ගෞරව තිළිණයන්ගෙන් ද බුහුමනට පාත්‍ර වී තිබේ.

## හවුල්කාරී සංවිධාන :

**ආර්ජන්ටිනාව:** නෛතික හා සමාජ අධ්‍යයන කේන්ද්‍රය (Centro Estudios Legales y Sociales - CELS), මානව හිමිකම් ආරක්ෂණය හා ප්‍රවර්ධනය සඳහා කැප වී ක්‍රියාකරන සංවිධානයකි. ආර්ජන්ටිනියානු හමුදා ඒකාධිපතිත්වය යටතේ පීඩාවට පත් වින්දිතයන්ගේ පවුල් සාමාජිකයන් පිරිසක් විසින් එය පිහිටුවන ලද්දේ 1979දී ය. එතැන් පටන්, ඒකාධිපති පාලන සමය තුළ සිදුකළ බරපතල මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වලට මෙන්ම, වර්තමාන ප්‍රජාතාන්ත්‍රික ක්‍රමය තුළ සිදුකැරෙන ව්‍යුහාත්මක මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට අදාළ නඩු විභාගවලදීත් දණ්ඩ මුක්තියට එරෙහිව CELS සංවිධානය සටන් කර තිබේ. පුරවැසි ආරක්ෂණය, පොලිස් ම්ලේච්ඡත්වය, බන්ධනාගාර තුළ පවත්නා තත්ත්වයන්, සමාජ-ආර්ථික හා සංස්කෘතික අයිතීන්, අධිකරණමය ආයතන සවිබලකරණය, අනාරක්ෂිත ජනකොටස්වලට යුක්තිය සඳහා ප්‍රවේශයන් සහතික කිරීම මෙන්ම විමර්ශන, සන්දේශන සහ නඩු පැවරීම් මගින් ආරක්ෂක හමුදා ප්‍රජාතන්ත්‍රීකරණය කිරීමට අදාළ කාරණා සම්බන්ධයෙන් CELS සංවිධානය සක්‍රීය වැඩ කොටසක් ඉටු කරයි.

**බ්‍රසීලය:** කොනෙක්ටාස් (CONECTAS) සංවිධානය, 2001 සැප්තැම්බරයේදී බ්‍රසීලයේ සන් පවුලෝ නගරයේ ආරම්භ කරන ලද රාජ්‍ය නොවන, ලාභ නොලබන සංවිධානයකි. සහයෝගිතා ජාලයන් හරහා ගෝලීය දකුණේ මානව හිමිකම් ආරක්ෂකයන් හා ශාස්ත්‍රඥයන් ශක්තිමත් කිරීමටත්, අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාකාරකම් අභිවර්ධනය කිරීමටත් කොනෙක්ටාස් සංවිධානය අරමුණු කරයි. එමෙන්ම, ගෝලීය දකුණේ රාජ්‍යයන්ගේ විදෙස් පිළිවෙත් නිරීක්ෂණයට බඳුන් කිරීම මගින් මානව හිමිකම් පිළිබඳ අන්තර් ජාතික ආරක්ෂණය ශක්තිමත් කිරීම ද එහි අරමුණකි. බ්‍රසීලය තුළ සන්දේශනය ප්‍රවර්ධනය කිරීමත්, උපායික සහ මහජන අභිලාෂයන් මූලික කොටගත් නෛතික ක්‍රියාමාර්ග ගැනීමත් සඳහා කොනෙක්ටාස් සංවිධානය කැප වී ක්‍රියා කරයි.

**චිලිය:** නෙල්සන් කවුකෝටෝ මානව හිමිකම් නීති ආයතනය 1978දී ආරම්භ කරන ලද්දේ පිනෝචේ පාලන සමයේදී චිලියානු කතෝලික පල්ලියට අනුබද්ධ මානව හිමිකම් සංවිධානයක් වූ විකරීයා දෙ ලා සොලිදරිදාද් (Vicariate of Solidarity) හි සේවය කළ නීතිඥයෙකු වන නෙල්සන් කවුකොතෝ විසිනි. 1995 සිට මෑතක් වන තුරුම මෙට්‍රොපොලිටන් අධිකරණ සහායක සමාගමේ ප්‍රධානියා වශයෙන් ක්‍රියා කළ කවුකෝතෝ චිලියේ අතුරුදහන්වූවන්ගේ ඥාතීන්ගේ සංගමයේ නීතිඥවරයා වශයෙන් ද ක්‍රියා කළේය.

**කොලොම්බියාව:** කොලොම්බියානු නීතිවේදී කොමිසම (Comisión Colombiana de Juristas), එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රඥප්තියේ අභිමතාර්ථයන් හා මූලධර්මයන්ට අනුකූලව ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය සංවර්ධනය කිරීමටත්, කොලොම්බියාවේ සමාජ හා ප්‍රජාතාන්ත්‍රික නීතියේ ආධිපත්‍යය පූර්ණ වශයෙන් බලාත්මක කිරීමටත් සහාය දක්වයි. ජිනීවා නුවර ජාත්‍යන්තර නීතිවේදීන්ගේ සංගමයේ හා ලීමා නුවර අන්දියානු නීතිවේදීන්ගේ කොමිසමේ සහධාරී සංවිධානයක් වන කොලොම්බියානු නීතිවේදී කොමිසම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ උපදේශන තත්ත්වය උසුළයි.

**පෙරු:** නීති ආරක්ෂණ ආයතනය (Instituto de Defensa Legal - IDL) වනාහී පෙරු රාජ්‍යයට සාමය ළඟාකරගනු පිණිස එහි මානව හිමිකම් ආරක්ෂා කොට සවිමත් කිරීමටත්, එහි ප්‍රජාතාන්ත්‍රික ආයතන තහවුරු කිරීමටත් කැප වූ රාජ්‍ය නොවන සංවිධානයකි. IDL ආයතනය 1983දී ආරම්භ කරන ලද්දේ, ත්‍රස්තවාදී ක්‍රමවේදයන් සහිත දේශපාලන සංවිධානයක් වූ 'දිදුලන මාවත' (Sendero Luminoso) කණ්ඩායම 1980 ගණන්වලදී මතුවීමත්, ඊට ප්‍රතිචාර වශයෙන්, මූලිකවම නිර්දෝෂී පුද්ගලයන්ට එරෙහිව මානව හිමිකම් උල්ලංඝණය කිරීමේ අඛණ්ඩ පිළිවෙතක් ආණ්ඩුව විසින් පවත්වාගෙන යාමත් හමුවේ ය.

**දකුණු අප්‍රිකාව / ලන්ඩන්:** සත්‍යය සහ යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP), ශ්‍රී ලංකාවේ යුද අපරාධවලින් සහ ආරක්ෂක හමුදාවන්ගේ පශ්චාත් යුද කාලීන මානව හිමිකම් උල්ලංඝණයන්ගෙන් දිවි ගළවාගත්තවුන් සහ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි ප්‍රකාශයන් එක්රැස් කිරීමෙහි නිරතව සිටින්නේ 2013 වසරේ සිට ය. වෛද්‍ය විද්‍යාත්මක සාක්ෂි හා අවශේෂ ලේඛන මගින් තහවුරු කරන ලද සවිස්තරාත්මක සාක්ෂි ප්‍රකාශයන් 300ක් සහිතව මේ වනවිට දිවයිනෙන් බැහැරව ඒකරාශී කළ විශාලතම සාක්ෂි ලේඛනාගාරය ITJP සංවිධානය සතුව පවතී. ව්‍යාපෘතිය විසින් අවධානය යොමුකොට ඇත්තේ රට අතහැර පලාගිය ශ්‍රී ලාංකිකයන්ගෙන් ප්‍රකාශ ඒකරාශී කිරීමට ය.